(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 151.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 මාර්තු මස 08 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්‍රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමල් වීරවංශ මහතා විසින් 2017 පෙබරවාරි මස 22 වැනි දින පාර්ලිමේන්තුවේ සභා ගර්භයේදී එතුමා ඇතුළු මන්ත්‍රීවරුන් පස් දෙනෙකු එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් වෙන්ව විරුද්ධ පාර්ශ්වයේ ස්වාධීන කණ්ඩායමක් වශයෙන් පිළිගන්නා ලෙස මතු කරන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් මාගේ තීරණය මෙම ගරු සභාවට ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ගරු විමල් වීරවංශ මහතා ඇතුළු පස් දෙනෙකු විසින් පාර්ලිමේන්තුව තුළ ජාතික නිදහස් පෙරමුණ වශයෙන් විපක්ෂයේ වෙනම ස්වාධීන මන්ත්‍රී කණ්ඩායමක් වශයෙන් පිළිගන්නා ලෙසත්, කණ්ඩායම් නායක ලෙස ගරු විමල් වීරවංශ මහතාට පක්ෂ නායක රැස්වීම්වලට සහභාගිවීමටත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 23(2) යටතේ විශේෂ ප්‍රකාශයක් කිරීමට එතුමාට තිබෙන අයිතිය පිළිගන්නා ලෙසත්, 2016 මාර්තු මස 09 වැනි දින ලිපියෙන් ඉල්ලා සිටින ලදී. මේ හා සමාන ප්‍රකාශයක් 2016 අප්‍රේල් මස 05 වැනි දින ගරු විමල් වීරවංශ මහතා විසින් එම ප්‍රශ්නය සම්බන්ධයෙන්ම මෙම ගරු සභාවේදී මතු කරන ලදී.

ඒ අනුව, මවිසින් තීරණය කළ යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව නීත්‍යානුකූල පදනමක් යටතේ පාර්ලිමේන්තුව තුළ 2015 අගෝස්තු මස 17 වැනි දින මහා මැතිවරණයට තරග කොට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2015 අගෝස්තු මස 19 වැනි දින අංක 1928/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද දේශපාලන පක්ෂ හය, එනම්, එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය, ඉලංගෙයි තමිල් අරසුකච්චි, ජනතා විමුක්ති පෙරමුණ, ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය යන පක්ෂ හයට අමතරව, වෙනත් දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් පාර්ලිමේන්තුව තුළ නීත්‍යානුකූලව පිළිගත හැකි ද යන්නයි.

මෙම පාර්ලිමේන්තුව තුළත්, ඊට ප්‍රථම පැවති පාර්ලිමේන්තුවලත් විවිධ අවස්ථාවන්හිදී මන්ත්‍රීවරුන් තමා තරග කළ පක්ෂයෙන් වෙන් වී ස්වාධීන මන්ත්‍රීවරුන් ලෙස විපක්ෂයේ වාඩි වී කටයුතු කරන ලද අවස්ථා බොහෝමයක් අප ඉතිහාසයේ සනිටුහන් වී ඇත. එම අවස්ථාවන්හිදී අදාළ මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරයෙකු වශයෙන් ලැබිය යුතු අයිතීන් ආරක්ෂා කර දීමට විශේෂයෙන්ම පාර්ලිමේන්තුව තුළ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, කථානායකවරයා මැදිහත්වී ලබා දුන් අවස්ථා බොහොමයක් ද ඇත. විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරුන් ලෙස වාඩි වී සිටින එවැනි මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පරිපාලනමය වශයෙන් ද විවිධ ක්‍රියාදාමයන් පසුගිය කාලයේ අනුගමනය කිරීමට යෙදුණි.

මමත්, මගේ පූර්වගාමී කථානායකවරුනුත්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසිනුත් විවිධ අවස්ථාවන්හිදී මේ හා සමාන කරුණු පදනම් කර ගෙන විවිධ තීන්දු-තීරණවලට එළඹ ඇති බව තවදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

2015 අගෝස්තු 17 වැනි දින පවත්වන ලද මහ මැතිවරණයේදී කොළඹ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් ගරු විමල් වීරවංශ මහතා තරග කර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලද බව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වැනි වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2015 අගෝස්තු මස 19 වැනි දින අංක 1928/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, ගරු විමල් වීරවංශ මන්ත්‍රීවරයා පසුගිය මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය කොට එම පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වී සිටින බවත්, එම මැතිවරණයේදී මැතිවරණයට ඉදිරිපත් වූ පිළිගත් දේශපාලන පක්ෂ හයකින් (6) මන්ත්‍රීවරුන් තේරී පත්ව සිටින බවත්, එය 2015 අගෝස්තු මස 19 වැනි දින අංක 1928/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශයට පත් කොට ඇත.

2015 සැප්තැම්බර් මස 01 වැනි දින ආරම්භ වූ වත්මන් අටවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ නායකයන් විසින් ද, වත්මන් අටවැනි පාර්ලිමේන්තුව තුළ පිළිගත් දේශපාලන පක්ෂ හයක් පමණක් නියෝජනය කරන බව ඒකමතිකව පිළිගෙන

තිබෙන බවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කාර්ය සටහන්වල ද වාර්තා වී තිබෙන බව සඳහන් කරනු කැමැත්තෙමි.

තවද, මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රකාශ කිරීම අනුව, අටවැනි පාර්ලිමේන්තුවේ පිළිගත් දේශපාලන පක්ෂ 06 ඇතුළත සමන්විත වන වෙනත් දේශපාලන කණ්ඩායම් හෝ පක්ෂ කවරේද යන්න හෝ ඔවුන් අතර ඇති කොට ගෙන තිබෙන ගිවිසුම් මොනවාද යන්නත්, ඒවායේ අඩංගු කරුණු හෝ කොන්දේසි මොනවාද යන්නත් කථානායකවරයා ලෙස මාගේ අවධානයට භාජනය නොවන අතරම, එවැනි අභ්‍යන්තර සන්ධාන තත්ත්වයන් දැන ගැනීම හෝ ඒ පිළිබඳව දැනුවත් වීම හෝ කථානායකවරයා ලෙස මාගේ ධුරයට විෂයගෝචර නොවන බවත් මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුව තුළ කටයුතු සඳහා පිළිගත යුතු පක්ෂ මොනවාද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව නීත්‍යානුකූල පදනමකින් තීරණය කළ යුතු බව මාගේ අදහසයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 ව්‍යවස්ථාවේ (13) අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ ඔහු මැතිවරණය සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලද දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම අතර සහසම්බන්ධතාව පහත සඳහන් ලෙස දක්වා ඇත.

කිසියම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තේරී පත් වූ අවස්ථාවේදී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍රයේද, ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ හෝ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ නතර වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම නතර වූ දින සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත් වූ විට ඔහුගේ අසුන හිස් වන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 ව්‍යවස්ථාවේ (13) අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ ප්‍රකාරව සඳහන් බව ප්‍රකාශ කරමි.

තවද, දහනම වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සංයුක්ත කිරීමේදී 41අ. (1) ව්‍යවස්ථාවේ (ඊ) අනුඡේදය යටතේ අග්‍රාමාත්‍යවරයා සහ විපක්ෂ නායකවරයා නියෝජනය වන පක්ෂ දෙක හැර, අනෙකුත් පක්ෂවල සහභාගිත්වයෙන් එක් මන්ත්‍රීවරයකුගේ නාම යෝජනාව ඉදිරිපත් වන බැවින් පාර්ලිමේන්තුව නියෝජනය වන අනෙකුත් පක්ෂ මොනවාද යන්න නීත්‍යානුකූල පදනමකින් සලකා බැලීම නොකළහොත් එම ක්‍රියාවලියේදී අර්බුද රාශියකට මුහුණ දීමට සිදු වේ.

ප්‍රායෝගිකව සලකා බැලීමේදීද යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ කණ්ඩායමකින් නාමයෝජනා භාරදී මැතිවරණය තරග කොට, පසුව ස්වාධීනව කටයුතු කිරීමට තීරණය කරන මන්ත්‍රීවරයෙකු හෝ මන්ත්‍රී කණ්ඩායමක් මැතිවරණයේදී නාමයෝජනා භාරදී තරග කොට පාර්ලිමේන්තුවට තේරී පත්වූ පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් සතුව අයිතිවාසිකම් හෝ වරප්‍රසාද ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන්නේ නම්, ඊට ඉඩ දීමෙන් පාර්ලිමේන්තුව තුළ තනි මන්ත්‍රීවරුන් සහිත පක්ෂ, මන්ත්‍රීවරුන් කණ්ඩායම් සිටින පක්ෂ වශයෙන් විවිධ අවස්ථාවන්වලදී අලුත් පක්ෂ හෝ කණ්ඩායම් නිර්මාණය වී සමස්ත පාර්ලිමේන්තු ක්‍රියාදාමය කඩා වැටීමකටත් පාර්ලිමේන්තු වරප්‍රසාද අයුතු ලෙස භාවිත කිරීමටත් අවස්ථාවක් නිර්මාණය වේ.

මේ හා සමාන අවස්ථාවන් මීට පෙර මතු වූ අවස්ථාවන්හිදී මාගේ පූර්වගාමී කථානායකවරයන් විසින් මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත්, පාර්ලිමේන්තු කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අදාළ ප්‍රායෝගික තීන්දු තීරණ ගනු ලැබූ අවස්ථාවන් බොහොමයක් පසු ගිය කාල වකවානුවේදී දැක ගැනීමට හැකි විය.

වර්තමානයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී කණ්ඩායම විපක්ෂයේ අසුන්

ගැනීමට තීරණය කළ අවස්ථාවේදී විපක්ෂයේ අසුන් ලබා දී ඔවුන්ට විවාදවලට සහභාගිවීම සඳහා අවශ්‍ය කාල වේලා ලබා දීමට මා පෞද්ගලිකවත්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා මඟිනුත් කටයුතු කොට ඇත.

තවද, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ එකඟත්වය ඇතිව, එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 23(2) යටතේ හදිසි සහ පොදු වැදගත්කමක් සහිත කරුණක් පිළිබඳව ප්‍රශ්න අවසානයේදී ප්‍රකාශයක් කිරීම සඳහා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාටද අවකාශ සලසා දී ඇත.

මේ හා සමාන ක්‍රියාදාමයක් මාගේ පූර්වගාමී කථානායකවරයා විසින් ද අනුගමනය කොට තිබිණි. එසේ ප්‍රායෝගිකව පාර්ලිමේන්තුව තුළ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ එකඟත්වයෙන් යම් අයිතිවාසිකම් ලබා දුන්නද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුව පූර්ණ වශයෙන් නීතියෙන් පිළිගැනෙන නව පක්ෂයක් හෝ කණ්ඩායමක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපනය කිරීමට කථානායක වශයෙන් මටත්, පාර්ලිමේන්තුවටත් කළ නොහැකි දෙයකි.

ඒ අනුව, නෛතික වශයෙන් පාර්ලිමේන්තුවට පිළිගත හැක්කේ නාම යෝජනා භාර දී පාර්ලිමේන්තුවට තේරී පත් වූ අදාළ ගැසට් නිවේදනයේ සඳහන් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් පමණක් බවත්, අවස්ථානුගතව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම තමන්ගේ අදහස් අනුව ක්‍රියා කිරීමේදී තමන්ගේ කැමැත්ත අනුව නියෝජනය කිරීමට බලාපොරොත්තු වන කණ්ඩායමක් හෝ පක්ෂයක් හෝ නොවන බව අවධාරණය කරනු කැමැත්තෙමි.

ඒ කෙසේ වෙතත් මන්ත්‍රීවරයෙකු වශයෙන් එක් එක් මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුව තුළ හිමිවන අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත්, එම අයිතිවාසිකම් කඩ වන අවස්ථාවන්වලදී ඊට මැදිහත්ව ක්‍රියා කිරීමටත් මා කිසි දිනක පසුබට නොවන බවද තවදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

මේ කරුණ ගැන විවිධ අවස්ථාවල සෑම පාර්ශ්වයකින්ම අදහස් ප්‍රකාශ කර ඇති අතර, මෙම තීරණය ගැනීමේදී එම සියලුම අදහස් සම්බන්ධයෙන් මා අවධානය යොමු කළ බවත් සඳහන් කරනු කැමැත්තෙමි. එසේ හෙයින් තවදුරටත් මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමක් හෝ වාද විවාද පැවැත්වීමේ කිසිදු අවශ්‍යතාවක් නොමැති බව මම අවධාරණය කරමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු තිලක් මාරපන මහතා විසින්, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ලකී ජයවර්ධන මහතා විසින්, සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2006 අංක 27 දරන ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) යටවත්ත, පමුණුදෙනිය, "සෞභාග්‍යා" යන ලිපිනයෙහි පදිංචි එස්. එම්. එස්. කේ. හදුගොඩ මහත්මියගෙන් ලැබුණු 2016.11.28 දිනැති පෙත්සම; සහ

(ii) මාතලේ, කොටුවේගෙදර, ඒ ජනපදය, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි එස්. ටී. සිල්වා මහතාගෙන් ලැබුණු 2016.12.03 දිනැති පෙත්සම

ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) නුගේගොඩ, දේවාල පටුමග, අංක 23/9 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එස්. එච්. ජේ. ද අල්විස් මහතාගෙන් ලැබුණු 2017.01.13 දිනැති පෙත්සම;

(ii) මත්තේගොඩ, වෙද නිවස, අංක 121 දරන ස්ථානයෙහි පදිංචි (වෛද්‍ය) ඩී. ගුණවර්ධන මහත්මියගෙන් ලැබුණු 2017.01.20 දිනැති පෙත්සම;

(iii) මාතර, පාලටුව, "ලක්මාල්" යන ලිපිනයෙහි පදිංචි ජී. ඩබ්ලිව්. කරුණාවතී මහත්මියගෙන් ලැබුණු 2017.02.11 දිනැති පෙත්සම;

(iv) පොල්ගස්ඕවිට, කිරිගම්පමුණුව, අංක 154 දරන ස්ථානයෙහි පදිංචි ජේ. සෝමදාස මහතාගෙන් ලැබුණු 2016.12.05 දිනැති පෙත්සම; සහ

(v) මාතර, පොල්හේන, දෙවන හරස් පාර, අංක 9/3 දරන ස්ථානයෙහි පදිංචි යූ. එච්. ජයලත් මහතාගෙන් ලැබුණු 2016.11.02 දිනැති පෙත්සම

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ඒලාලයි, ඒලාලයි බටහිර යන ලිපිනයෙහි පදිංචි එස්. නාගරාසා මහතාගෙන් ලැබුණු 2016.07.12 දිනැති පෙත්සම ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා විසින් පිළිගන්වන ලදී.

(4) දොඩංගොඩ, ගංඉම, හර්මන්වත්ත II, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එන්. කේ. ඩී. අසංක මහතාගෙන් ලැබුණු 2016.10.10 දිනැති පෙත්සම ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(5) ඉහළ කොට්ටාරමුල්ල, මොරකැලේ, පල්ලිය පාර යන ලිපිනයෙහි පදිංචි යූ. අයි. ක්වින්ටස් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2017.01.23 දිනැති පෙත්සම ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් පිළිගන්වන ලදී.

(6) තම්බියාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විල්පත්තුව බලකායේ සේවය කරන බී. ජී. ඩී. දේශප්‍රිය මහතාගෙන් ලැබුණු 2016.12.01 දිනැති පෙත්සම ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

රැස්වීම තාවකාලිකව අත්හිටවීම

අ.භා. 1.24

අ.භා. 1.41 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ.භා. 1.41

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

රැස්වීම තාවකාලිකව අත්හිටවීම

අ.භා. 2.06

අ.භා. 2.26 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ.භා. 2.26

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

රැස්වීම තාවකාලිකව අත්හිටවීම

අ.භා. 2.38

අ.භා. 3.14 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ.භා. 3.14

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

එකල්හි ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මූලාසනයේ අණ නොසළකා හැරියෙන් කථානායකතුමා පාර්ලිමේන්තුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා නම් කළේය.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 මාර්තු මස 08 වැනි දින සභාවේදී බරපතල ලෙස විනය විරෝධීව හැසිරීම සම්බන්ධයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව අත්හිටුවීමට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 74(2) සමඟ කියැවෙන අංක 72(1) වගන්තිය යටතේ කථානායකවරයාට විසින් නම් කරන ලදුව, ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව තහනම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 85; විරුද්ධව 22; වැළකී 3 යනුවෙන් බෙදී එය සභා සම්මත විය.

**පක්ෂව**

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු වජිර අබේවර්ධන මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු විජිත් විජයමුණි සොයිසා මහතා
ගරු ඩී. එම් ස්වාමිනාදන් මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
ගරු තිලංග සුමතිපාල මහතා
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා
ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු සිසිර කුමාර අබේසේකර මහතා
ගරු ජේ. සී අලවතුවල මහතා
ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු චන්දිම ගමගේ මහතා
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු එම්. එස්. තෞෆික් මහතා
ගරු සිරිනාල් ද මෙල් මහතා
ගරු මොහොමඩ් නවවි මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු සෙය්යිඩ් අලී සහීර් මවුලානා මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු තිලක් මාරපන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු හේෂාන් විතානගේ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
ගරු අන්නාමලෙ නඩේසු සිවශක්ති මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

**විරුද්ධව**

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු දිළුම් අමුණුගම මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු විමල් වීරවංශ මහතා

**වැළකී සිටි**

ගරු අනුර දිසානායක මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු විජිත හේරත් මහතා

එකල්හි දිනේෂ් ගුණවර්ධන මහතා, පාර්ලිමේන්තුවෙන් පිටවූයෙන් යළිත් පාර්ලිමේන්තුව රැස් විය.

**5. ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත :** පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා. 3.55 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා. 6.11 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

''විවාදය දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඊට අනුකූලව විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය ඉදිරි දිනයක පවත්වනු ලැබේ.

**6. කල් තැබීම (ආරක්ෂක හමුදා සන්තකව පවතින ඉඩම් මුල් අයිතිකරුවන් වෙත නිදහස් කිරීම) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.22 ට, 2016 මාර්තු මස 08 වැනි දින සභා සම්මතිය අනුව, 2017 මාර්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.